# 55

# රිද්දි යාගයෙහි සන්නිවේදන ලක්ෂණ

*ඩී.එම්. ප්‍රියංකා රමණී* [1]

පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත රිද්දි යාගයෙහි දක්නට ලැබෙන සන්නිවේදන ලක්ෂණ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වේ. රට යකුම, රිද්දි යාගය යන නම්වලින් හඳුන්වනු ලබන මෙම ශාන්තිකර්මය පහතරට ප්‍රදේශයන්හි යකුන් උදෙසා පවත්වනු ලබන ප්‍රධාන ශාන්තිකර්ම අතර විශේෂ වේ. රට යකුම ප්‍රචලිත ප්‍රදේශ ලෙස මාතර, බෙන්තර ආදී ප්‍රදේශ දැක්විය හැකිය. මෙකී ප්‍රදේශයන් හි බොහොමයක් ශිල්පීහු මෙම ශාන්තිකර්මය හඳුන්වන්නේ රිද්දි යාග මංගල්‍යය යනුවෙනි. සිංහල නර්තන ක්ෂේත්‍රයේ භාව පූර්ණ නෘත්‍ය ගති ලක්ෂණ අන්තර්ගත එකම සිංහල ශාන්තිකර්මය වීම සහ කාන්තාවන් උදෙසා යකුන් විෂයෙහි පවත්වන එකම ශාන්තිකර්මය ද මෙය වීම මෙහිදී කැපී පෙනේ. පුරාවෘත්තයේ කියැවෙන පරිදි රිද්දි යාගයේ පුද ලබන රිද්දි බිසෝවරු විල්ලෝඩි දේශයේ ඉපිද ලංකාවේ වලවේ ගංතෙරට ආසන්න උසන්ගොඩින් ලක්දිවට ගොඩබට පිරිසකි. රිද්දි යාගයෙහි අන්තර්ගත පුදපූජා චාරිත්‍රවාරිත්‍ර ආතුරයා හට මානසික ප්‍රතිකර්මයක් වන අතරම එමගින් ආධ්‍යාත්මික ගුණ වගාව ද අපේක්ෂා කෙරේ. රෝග නිවාරණය ද රිද්දි යාගයෙන් සිදුවේ. ශාන්තිකර්මයේ දී යොදාගන්නා දෙබස්, බෙර පද, ගායනා, අනුරූපණ මගින් මානසික සුවය ආතුරයා හට ලැබේ. විවාහයෙන් පසුව කාන්තාවක් දරු එල ලබා ගැනීම සඳහා ලිංගික කාර්යයට සූදානම් වන බව, මාතෘත්වය, දයාව, කරුණාව, සෙනෙහස, ආදරය ආදී සාමාජයීය සහ මානසික සාදක ද රිද්දි යාගය තුළ ගැබ් ව ඇත. මෙම පර්යේෂණය සඳහා නියැදි ලෙස උපයෝගී කරගනුයේ බෙන්තර සම්ප්‍රදායට අයත් රට යකුමේ පුද පූජා පිළිවෙත් රටාවයි. රිද්දි යාගයේ නාට්‍යමය පෙළපාළි ද ඒ අතර සුවිශේෂී වේ. දැනට ලියැවී ඇති පොත් පත් මගින් ලබා ගන්නා දත්ත ද ඉහත අරමුණු විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කර ගැනීමට අපේක්ෂිතය. වර්තමානයේ මෙම ශාන්තිකර්මය අභාවයට යන බැවින් මෙවැනි පුද පූජා පිළිවෙත් තුළින් වන සමාජ සන්නිවේදනය අවම වී ඇත. මේ සඳහා ලබා ගන්නා තොරතුරු සහ පර්යේෂණයේ දී හඳුනාගන්නා ලද සාධක විශ්ලේෂණය කිරීමේ දී රිද්දි යාගය සමාජ යථාර්ථය සමකාලීන සමාජ සංස්ථාවෙහි ස්ථාපනය කිරීමට ගන්නා ලද උත්සාහය හඳුනාගත හැකිය.

මුඛ්‍ය පදඃ රිද්දි යාගය, සන්නිවේදනය, පුද පූජා විධි

---

*1 ප්‍රාසංගික කලා ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර*